2020 01. 14 මව්බිම පිටුව 5

# නව තාක්ෂණය මඟින් කරන ප්‍රථම ජන සංගණනය ලබන වසරේ

**ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්**

නුවන් හෙට්ටිආරච්චි

නව තාක්ෂණය යොදා ගනිමින් කරන ප්‍රථම ජන සංගණනය එළැඹෙන 2021 වසරේ සිදු කරන බව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සඳහන් කරයි.

නව තාක්ෂණය යටතේ 2021 වසරේ සිදුකිරීමට නියමිත ජන හා නිවාස සංගණනය සඳහා පූර්ව පරීක්ෂාවන් මේ වනවිට ආරම්භ කර ඇති බවද ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් අයි.ආර්. බණ්ඩාර මහත්මිය පවසයි.

ඊට රජය විසින් රුපියල් මිලියන 2500ක මුදලක් ඇස්තමේන්තු කර ඇති බවත් ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තු නිලධාරීන්, ග්‍රාම නිලධාරීන් හා ක්ෂේත්‍ර නිලධාරීන් 44,000ක් පමණ මෙම ජන සංගණනය සඳහා සහභාගි වන බවත් ඇය සඳහන් කළාය.

මෙවර නව තාක්ෂණය යටතේ සංගණනය කිරීමට සැලසුම් කර ඇති බවත් ඊට ටැබ් පරිගණක හා ස්මාට් දුරකථන මඟින් දත්ත රැස් කරන බවත් අධ්‍යක්ෂ ජනරාල්වරිය වැඩිදුරටත් පැවැසුවාය.